**තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන උපකරණ සහ පරිගණක ජාලකරණ පද්ධතිය සේවා සහ නඩත්තු කිරීමේ කාර්යය පවත්වාගෙන යාම සඳහා මිළ ගණන් කැඳවීම පිළිබඳ පූර්ව ප්‍රසම්පාදන රැස්වීම් වාර්තාව -** ශික්ෂණ රෝහල, පේරාදෙණිය.

- දිනය සහ වේලාව : - 2026 ජුනි මස 08 වන දින පෙ.ව 10.30
- ස්ථානය : - රෝහල් සාකච්ඡා කාමරය
- සහභාගිවූ නිළධාරින් ; - 01. වෛද්‍ය. M.M.S.S.K. නවනැලිය මයා,
  නියෝජ්‍ය අධ්‍යක්ෂ,ශික්ෂණ රෝහල, පේරාදෙණිය.
  02. ආචාර්ය S. නාමල් කරුණාරත්න මහතා,
  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පරිගණක ඉංජිනේරු දෙපාර්තමේන්තුව,
  ඉංජිනේරු පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
  03. වෛද්‍ය G.K.M.E. ජානක මහතා,
  විශේෂඥ වෛද්‍ය නිලධාරී - සෞඛ්‍ය තොරතුරු,
  සෞඛ්‍ය තොරතුරු හා පර්යේෂණ ඒකකය,
  ශික්ෂණ රෝහල, පේරාදෙණිය.
  04. එන්.එච්.එස්.කේ. ධර්මරත්න මහතා,
  සංවර්ධන නිලධාරී, සෞඛ්‍ය තොරතුරු හා පර්යේෂණ ඒකකය,
  ශික්ෂණ රෝහල, පේරාදෙණිය.
- සහභාගිවූවන් :-
  01. නලින්ත තිලකරත්න - Arrogance Technologies (Pvt) Ltd
  02. අයි.බී.රත්නායක - Lanka System Solutions
  03. එච්.ජේ.එම්.විමලරත්න - Hayley's Fentons
  04. මධුර අනුරංග - Gestetner of Ceylon PLC
  05. අසිත කුලතුංග - Gestetner of Ceylon PLC
  06. තිවාන් ද සිල්වා - Gestetner of Ceylon PLC
  07. සංජය පුස්සේගොඩ - Softlogic
  08. ලහිරු වික්‍රමසිංහ - Softlogic
  09. සංජය විදානගේ - Debug Computers

පූර්ව ප්‍රසම්පාදන රැස්වීම ආරම්භයේදී, ටෙන්ඩර්කරුවන්ගේ නියෝජිතයින්ට ප්‍රසම්පාදන ක්‍රියාවලිය, ටෙන්ඩර් ලේඛනයේ නියමයන් සහ කොන්දේසි, සහ මෙම කාර්යෙහි සේවා විෂය පථය පිළිබඳව රෝහල් නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය. M.M.S.S.K. නවනැලිය මහතා විසින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. ඉන් අනතුරුව ටෙන්ඩර්කරුවන් විසින් පහත දැක්වෙන විමසීම් ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා පැහැදිලි කිරීම් පහත දක්වා ඇත:

| | ඉදිරිපත් කරන ලද විමසීම | පැහැදිලි කිරීම |
|---|---|---|
| 1 | Network Backup Items රෝහල විසින් සපයන්නේ ද නැතහොත් කොන්ත්‍රාත්කරු විසින් ලබාදිය යුතුද යන්න ලංසු කරුවන් විසින් විමසන ලදී | රෝහල විසින් Network Backup Items ලබාදෙන බවත් ඒවා සංශෝධිත ලංසු ලේඛනයේ 44 පිටුවේ ඇතුලත් කරන බවත් දන්වන ලදී |
| 2 | මෙම කාර්යය සඳහා ලංසු කරුවන් තෝරා ගැනීමේදී PCA - 3 සහතිකය අවශ්‍ය වන්නේදැයි විමසා සිටින ලදී | එය අවශ්‍යතාවය අතපසුවීමකින් ලංසු ලේඛනය තුළ සඳහන් නොවන බවත්, මෙම ලංසුව මිලියන 05 ට වැඩි ඇස්තමේන්තු වටිනාකමක් ඇති බැවින් මේ සඳහා අදාළ සුදුසුකම අවශ්‍ය බවට වගන්තිය සංශෝධිත ලංසු ලේඛනයේ 13 හා 07 පිටු තුළ ඇතුළත් කරන බව දන්වන ලදී |
| 3 | ලන්සු ලේඛනයෙහි මාතෘකාව තුළ “Comprehensive Hardware and Network maintenance Service” යන්න මගින් සියලු උපකරණ උපාංග ලංසුකරු විසින් සපයාගත යුතු වැනි අදහසක් පෙනීයන බවත් ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් ලබාදෙන ලෙස දන්වා සිටින ලදී | මෙමගින් “Hardware සහ Network අයිතම සඳහා පුළුල් නඩත්තු සේවාවක් ලබාදීම” යන්න අදහස් කරන බව පැහැදිළි කරන ලදී.<br>Hardware සහ Network නඩත්තු සේවාවන් වලදී කොන්ත්‍රාත් කරු විසින් සපයා යෙදවිය හැකි, රෝහල විසින් ඒ සඳහා වන පිරිවැය දරනු ලබන අයිතම ලංසු ලේඛනයේ 25 පිටුවේ දක්වා ඇතිබව දන්වන ලදී.<br><br>උක්ත අයිතම ලැයිස්තුවට අමතර අයිතමයන් නඩත්තු සේවා අතරතුරදී භාවිතා කිරීමට සිදුවුවහොත් ඒවා සඳහා වන ගෙවීම් CECB තාක්ෂණික නිළධාරීන් විසින් ලබාදෙනු ලබන ඇස්තමේන්තුවක් අනුව රෝහල විසින් ගෙවීම් අනුමත කළ හැකිවන බවත් එසේ නැතහොත් එවැනි නඩත්තු කාර්යයක් සඳහා හෙදවීමට සිදුවන උපාංග රෝහල විසින් මිළදීගෙන සැපයිය හැකි බවත් දන්වන ලදී.<br>එය සංශෝධිත ලංසු ලේඛනයේ 25 පිටුවේ දක්වා ඇත. |
| 4 | අවම වශයෙන් Hardware/ Network/HIMS Support officers දෙන්නෙක්වත් දිවා කාලයේදී රෝහල තුළ රැඳී සිටිය යුතු බවට දන්වා ඇති කාරණය පිළිබඳව පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින ලදී. | අවම වශයෙන් ICT Support Officers දෙන්නෙක්වත් දිවා කාලයේදී රෝහල තුළ රැඳී සිටිය යුතු බවත්, රෝහල විසින් දැනුම්දෙන අවස්ථාවකදී නව අමතර |

| | | |
|---|---|---|
| | | ICT /HIMS Support Officer කෙනෙකු යෙදවීමට සූදානම්ව තැබිය යුතු බවත් දන්වා සිටින ලදී.<br><br>රාත්‍රී සේවා මුරයේ දී ලංසු ලේඛනයේ සඳහන් ලෙස සාමාන්‍ය පරිදි එක් ICT /HIMS Support Officer කෙනෙකු ප්‍රමානවත් වන බව දන්වන ලදී.<br><br>මේ පිළිබඳව සංශෝධිත ලංසු ලේඛනයේ 29 පිටුවේ දක්වා ඇත. |
| 5 | Server වෙත Remote Access භාවිතා කිරීම සඳහා VPN Connection ස්ථාපිත කිරීමේදී එය කළ යුත්තේ Firewall හරහාද නැතහොත් Firewall Bypass කරමින් ද යන ගැටලුව විමසන ලදී. | එම VPN Connection ස්ථාපිත කිරීමේදී එය රෝහල විසින් ඉල්ලා සිටින පරිදි Through the Firewall හෝ Bypassing Firewall යන ඕනෑම අකාරයකින් එය ස්ථාපිත කිරීමට ලංසුකරු වෙත හැකියාව තිබිය යුතු බව දන්වන ලදී |
| 6 | වර්තමානයේ පවතින Firewall වලට අදාළ Hardware උපකරණ /උපාංගය වෙනුවට ඉදිරියේදී නව උපාංගයක් සවි කිරීමට නියමිත නම් නව නඩත්තු ගිවිසුමේ ඇතුළත් නඩත්තු කළයුතු hardware List තුළ ඇතුළත් කර ඇත්තේ මන්දැයි විමසා සිටින ලදී. | දැනට **Sophos Firewall** පද්ධතිය ක්‍රියාත්මක වන දෘඩාංග උපකරණය )Hardware Appliance) අනාගතයේදී නව උපකරණයකින් ප්‍රතිස්ථාපනය කිරීමට ඉඩ ඇතතිස්ථාපනය සිදුකරන තෙක්එම ප්‍ර ., දැනට භාවිතයේ පවතින උපකරණය අඛණ්ඩව ක්‍රියාත්මකව පවතිනු ඇත.<br><br>තවද, අලුතින් ස්ථාපනය කරනු ලබන ඕනෑම Firewall පද්ධතියක් සඳහා ද දෘඩාංග උපකරණ අවශ්‍ය වේ.<br><br>එබැවින්, නඩත්තු සේවාවේ විෂය පථය තුළ, දැනට භාවිතයේ පවතින හෝ අනාගතයේදී ස්ථාපනය කරනු ලබන ඕනෑම Firewall දෘඩාංග උපකරණයකට අදාළ නඩත්තු කටයුතු අවශ්‍යතාවය පිළිබඳ තීරුවක් අදාළ වගුව මගින් නිරූපණය කර ඇති බව දන්වන ලදී.<br><br>සංශෝධිත ලංසු ලේඛනයේ 33 පිටුවේ දක්වා ඇත. |

| | | |
|---|---|---|
| 7 | ලංසු විවෘත කරන දිනය තවත් සතියකින් දීර්ඝ කර ගැනීම සඳහා ලංසු කරුවන් විසින් ඉල්ලා සිටින ලදී | එය නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කළ නොහැකි බව නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමා විසින් දන්වන ලදී. |
| 8 | වගකීම් කාලය පවතින තොරතුරු තාක්ෂණික උපකරණ වල වගකීම අවසන් වන කාලයන් /දිනයන් වෙන වෙනම ඉල්ලා සිටින ලදී | සංශෝධිත ලංසු ලේඛනයේ 31 පිටුවේ දක්වා ඇත |
| 9 | රෝහලේ අවශ්‍යතාවය අනුව Local Area Network වෙත නව කොටසක් එකතුවීම වැනි අවස්ථාවලදී අමතර අය කිරීමකින් තොරව එම කොටස් මෙම සේවා ගිවිසුම මගින්ම ආවරණය කළ යුතු ද යන්න පිළිබඳව පැහැදිලි කිරීමක් ඉල්ලා සිටින ලදී | එවැනි අවස්ථාවකදී අදාළ නව කොටසද අමතර ගාස්තු අය කිරීමෙන් තොරව නඩත්තු සේවා සපයන්නාගේ සේවා ආවරණයට අනිවාර්යයෙන්ම අයත් විය යුතු බව දන්වන ලදී.<br>තවදුරටත්, දෛනික කාර්යයන් අතරතුරදී (Minor Network Extensions) ප්‍රමාණයෙන් කුඩා ජාල සබඳතාවය දිගු කිරීම් අවශ්‍ය වන විට එම කාර්යයන් ද කොන්ත්‍රාත් කරු/ සේවා සපයන්නා විසින් අමතර ගාස්තු අය කිරීමෙන් තොරව සම්පූර්ණ කොට දීයයුතු බව දන්වන ලදී.<br><br>සංශෝධිත ලංසු ලේඛනයේ 36 පිටුවේ දක්වා ඇත |

අධ්‍යක්ෂ,

ශික්ෂණ රෝහල,

පේරාදෙණිය.